# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා ලියාපදිංචි කිරීම - 2024

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා 2024 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචිවීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2023.11.15 දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

**අයදුම්පත පිරවීමට ප්‍රථම මෙම විස්තර පත්‍රිකාව කියවන්න**

01 .i. පහත සඳහන් වන අඩුපාඩු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත සම්පූර්ණ කර එය තැපැල් කිරීමට පෙර නිසි ලෙස සම්පූර්ණ කර තිබේ ද යන්නත්, අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා ඇත් ද යන්නත් පරීක්ෂා කර බැලීම අයදුම්කරුගේ වගකීම වේ.

1. අයදුම්පතේ දිනය සහ අත්සන නොමැති වීම,
2. අයදුම්පත සහතික කර නොමැති වීම,
3. ඡායා පිටපත් කර හෝ තමා විසින් ම සකස් කර ගන්නා ලද අයදුම්පත්,
4. තෝරා ගන්නා ලද විෂයයන් සඳහන් නොකිරීම,

ii. අයදුම්පතේ විමසා තිබෙන සියලු ම තොරතුරු සඳහන් කළ යුතුය. සඳහන් කිරීමට කිසිවක් නොවේ නම් "අදාළ නොවේ" යනුවෙන් හෝ "නැත" යනුවෙන් සඳහන් කළ යුතුය.

02. අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර 2023.11.15 හෝ එදිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.** අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බාහිර උපාධි - 2024" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

03. ඔබ මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ගනු ලබන්නේ ඔබගේ අධ්‍යාපන **සහතික පත්‍ර පරීක්ෂා කිරීමෙන්** පසුව බැවින්, අයදුම්පත හා සහතික කරන ලද සහතික පත් සමග පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් එවීම අනිවාර්ය බව සලකන්න.

04. අසම්පූර්ණ සහ අවසන් දිනයෙන් (2023.11.15 දිනෙන්) පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරණු ලැබේ.

05. **අධ්‍යයන පීඨය**

උපාධි පාඨමාලාව සඳහා අපේක්ෂකයකු ලියාපදිංචි කරගනු ලබන විෂය අනුව ඔහු/ඇය අයත් පීඨය තීරණය වේ. ඒ අනුව තෝරාගත් විෂයයන්ගෙන් තුනෙන් දෙකක් අයත් පීඨය ඔහු /ඇය අයත් පීඨය ලෙස සැලකේ.
ඉල්ලුම් කරන ලද විෂය පත්‍රයක් වෙනස් කිරීමට අවශ්‍යය වන්නේ නම් අදාළ පීඨයට අයත් විෂය පත්‍රයක් තෝරා ගත යුතුය. විෂය පත්‍ර වෙනස් කිරීමට අවස්ථාව ලැබෙනුයේ පාඨමාලාව ආරම්භ කර මාසයක් ඇතුළත පමණි.

06. විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකින් ම පැවැත්වෙන අතර, අයදුම්කරුවකු විසින් තෝරා ගත යුත්තේ ඉන් එක් භාෂා මාධ්‍යයක් පමණි. ලියාපදිංචි වීමෙන් පසුව භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

07. **නිර්දිෂ්ට අධ්‍යයන විෂයයන්**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා මෙම විශ්වවිද්‍යාලයේ අනුමත විෂයයන් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| 1. | බෞද්ධ දර්ශනය | බෞද්ධ අධ්‍යයන පීඨය |
| 2. | බෞද්ධ සංස්කෘතිය | |
| 3. | පුරාවිද්‍යාව | |
| 4. | සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය | |
| 5. | පාලි | භාෂා අධ්‍යයන පීඨය |
| 6. | සංස්කෘත | |
| 7. | සිංහල | |
| 8. | ඉංග්‍රීසි | |
| 9. | දෙමළ | |

**අනිවාර්ය විෂය**

10. පාලි නිර්දිෂ්ට ග්‍රන්ථ හා ත්‍රිපිටක සාහිත්‍යය අධ්‍යයනය (අනිවාර්ය විෂය පත්‍රය)
11. පාලි ව්‍යාකරණ අධ්‍යයනය (අනිවාර්ය විෂය පත්‍රය)
**(පාලි විෂය ප්‍රධාන විෂයයක් ලෙස තෝරා නොගන්නා අපේක්ෂකයන් අංක 09 සහ 10 දරණ පාලි විෂය පත්‍ර දෙක සඳහා අනිවාර්යයෙන් පෙනී සිටිය යුතුය.)**
12. ඉංග්‍රීසි භාෂා ප්‍රවේශය (English Proficiency)
13. තොරතුරු තාක්ෂණය (Information Technology)
**(අංක 11 සහ 12 යන විෂය පත්‍ර දෙක සියලුම අපේක්ෂකයන් සඳහා අනිවාර්ය වේ.)**

**08. තෝරාගත හැකි අතිරේක විෂයයන්**

| | |
|---|---|
| බෞද්ධ මනෝවිද්‍යා උපදේශනය | **සියලු ම අපේක්ෂකයන් මෙම අතිරේක විෂයයන් තුන අතුරින් එක් විෂයක් තෝරාගැනීම අනිවාර්ය වේ.** |
| සිංහල ව්‍යාකරණ ප්‍රවේශය | |
| දෙමළ භාෂා ප්‍රවේශය | |

09. **විෂයයන් තෝරා ගැනීම හා අධ්‍යයන සම්භාර ආවරණය කිරීම**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව කොටස් තුනකින් යුක්තය.

1. ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය
2. ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය
3. ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව හදාරන සිසුන් සියලු දෙනා බෞද්ධ දර්ශනය හෝ බෞද්ධ සංස්කෘතිය යන විෂයයන් දෙකින් එකක් අනිවාර්යයෙන් තෝරා ගත යුතු අතර, දෙවන හා තෙවන විෂය අපේක්ෂකයාගේ කැමැත්ත පරිදි තෝරාගත හැකිය.

**සැ.යු. :**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ඉංග්‍රීසි ප්‍රධාන විෂයක් ලෙස තෝරා ගත හැක්කේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව හෝ ලංකාවේ වෙනත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමන ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාවකින් සමත් වූ සිසුන්ට සහ උසස් පෙළ සඳහා ඉංග්‍රීසි ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති සිසුන්ට පමණි.**

එසේම සිසුන් සියලු දෙනා අනිවාර්ය පාලි විෂය පත්‍ර දෙක ද (පාලි විෂය ප්‍රධාන විෂයයක් ලෙස තෝරා නොගන්නා සිසුන් පමණි.) අනිවාර්ය ඉංග්‍රීසි විෂය පත්‍රය (ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව) හා තොරතුරු තාක්ෂණය විෂය පත්‍ර දෙක ද සමත් විය යුතුය. පාලි විෂය ප්‍රධාන විෂයයක් ලෙස තෝරාගෙන ඇති සිසුන් අනිවාර්ය පාලි විෂය පත්‍ර දෙක තෝරා ගතයුතු නැත. සිසුන් සියලු දෙනා අතිරේක විෂයක් ද තෝරාගත යුතු ය.

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව අධ්‍යයන සම්භාර 90කින් සමන්විත වේ. එක් උපාධි පරීක්ෂණයක් සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් වන පරිදි අපේක්ෂකයා තම විෂය ඒකක තෝරා ගත යුතු ය. ප්‍රධාන විෂයයන් තුන සඳහා විෂය පත්‍ර දහඅටක් (18) වන අතර වසර තුන අවසානයේ ඉන් අධ්‍යයන සම්භාර 72ක් හිමි වේ. පාලි විෂය තෝරා ගතහොත් අධ්‍යයන සම්භාර 78 ක් හිමිවේ. (පාලි විෂය පත්‍රයක් සඳහා අධ්‍යයන සම්භාර 05 ක් හිමි වන බැවිනි.) පාලි විෂය ප්‍රධාන විෂයයක් ලෙස තෝරා නොගන්නා සිසුන් අනිවාර්ය පාලි පත්‍ර දෙක තෝරාගත යුතු වන අතර එයට අධ්‍යයන සම්භාර 6 ක් හිමි වේ. ඔවුන් තවත් අතිරේක විෂයයක් ද තෝරාගත යුතුය. ඉන් අධ්‍යයන සම්භාර 4ක් හිමි වේ. ඉංග්‍රීසි විෂය සඳහා අධ්‍යයන සම්භාර 4ක් ද පරිගණක විෂය සඳහා අධ්‍යයන සම්භාර 4ක් ද වශයෙන් එම විෂය පත්‍ර දෙක සඳහා අධ්‍යයන සම්භාර 08ක් හිමි වේ. අධ්‍යයන සම්භාර හිමිවන ආකාරය පහත දැක්වේ.

### පාලි විෂය ප්‍රධාන විෂය ලෙස තෝරා නොගන්නා සිසුන්ගේ අධ්‍යයන සම්භාර ආවරණය කිරීම

| **විෂය** | **විෂය පත්‍ර** | **අධ්‍යයන සම්භාර** |
|---|---|---|
| ප්‍රධාන විෂය 03 | 18 (වර්ෂ තුනට) (18×4) | 72 |
| අනිවාර්ය ඉංග්‍රීසි | 01 | 04 |
| අනිවාර්ය පරිගණක | 01 | 04 |
| අනිවාර්ය පාලි | 02 | 06 |
| අතිරේක විෂය | 01 | 04 |
| | | 90 |

## පාලි විෂය ප්‍රධාන විෂය ලෙස තෝරා ගන්නා සිසුන්ගේ අධ්‍යයන සම්භාර ආවරණය කිරීම

| විෂය | විෂය පත්‍ර | අධ්‍යයන සම්භාර |
|---|---|---|
| ප්‍රධාන විෂය 03 | 18 | 78 (පාලි පත්‍රයකට අධ්‍යයන සම්භාර 05 කි ) |
| අනිවාර්ය ඉංග්‍රීසි | 01 | 04 |
| අනිවාර්ය පරිගණක | 01 | 04 |
| අතිරේක විෂය | 01 | 04 |
| | | 90 |

සිංහල භාෂාව ප්‍රධාන විෂයයක් වශයෙන් තෝරා ගන්නා අපේක්ෂකයින්ට අතිරේක විෂයයක් වන "සිංහල ව්‍යාකරණ ප්‍රවේශය" විෂය පත්‍රය තෝරාගත නොහැකිය.

ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය සඳහා තෝරාගත් විෂයයන් ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය සහ ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය සඳහා ද තෝරාගත යුතු වේ. තෝරාගත් විෂයයන් හා අතිරේක විෂයයන් අදාළ කාල සීමාවෙන් පසු වෙනස් කිරීම හා එහි මාධ්‍යය වෙනස් කිරීමට අවස්ථාව නොලැබෙන බව කරුණාවෙන් සලකන්න.

අනිවාර්ය විෂය පත්‍ර සියල්ල පැවැත්වෙනුයේ ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණයේ දී ය. යම් අපේක්ෂකයකුට පළමු අවස්ථාවේ දී එම විෂය ඒකක සමත් විය නොහැකි වුවහොත් එය අපේක්ෂකයාගේ අභිමතය පරිදි අධ්‍යයන වර්ෂ පහක් ඇතුළත පෙනී සිට සම්පූර්ණ කළ හැකිය. එම කාල සීමාව තුළ උක්ත පත්‍ර සමත් වීමට නොහැකි සිසුන්ගේ ලියාපදිංචිය අවලංගු වේ.

### 10. විභාග පැවැත්වීම

බාහිර විභාග විශ්වවිද්‍යාලය මගින් සෑම වසරක ම වර්ෂාවසානයේ පැවැත්වීමට කටයුතු කරන අතර ලියාපදිංචි වී සිටින විෂයයන්ට පමණක් අදාළ පරීක්ෂණයේ දී පෙනී සිටීමට අවසර ඇත. විභාග පැවැත්වෙන දිනය පුවත්පත් මගින් හෝ පෞද්ගලිකව හෝ අන්තර්ජාලය මගින් අපේක්ෂකයන්ට දැනුම් දෙනු ලබන අතර, විභාග ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් ඔවුන් වෙත තැපැල් මගින් යවනු ලැබේ.

### 11. ගාස්තු

**ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල**

| | | |
|---|---|---|
| විස්තර හා අයදුම්පත් ගාස්තු | - | රු. 750.00 |
| ශිෂ්‍ය වාර්තා පොත සඳහා | - | රු. 350.00 |
| විෂය නිර්දේශය | - | රු. 500.00 |
| ලියාපදිංචි ගාස්තු | - | රු. 1000.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම | - | රු. 400.00 |
| දේශන ගාස්තු | - | රු.16500.00 |
| සම්මන්ත්‍රණ ගාස්තු | - | රු. 1500.00 |
| විභාග ගාස්තු | - | රු. 7500.00 |
| **ගෙවිය යුතු මුළු ගාස්තු** | - | **රු.28500.00** |

**ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල**

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | - රු. | 1000.00 |
| දේශන ගාස්තු | - රු. | 14000.00 |
| සම්මන්ත්‍රණ ගාස්තු | - රු. | 1500.00 |
| විභාග ගාස්තු | - රු. | 5000.00 |
| **ගෙවිය යුතු මුළු ගාස්තු** | **- රු.** | **21500.00** |

**ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල**

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | - රු. | 1000.00 |
| දේශන ගාස්තු | - රු. | 14000.00 |
| සම්මන්ත්‍රණ ගාස්තු | - රු. | 1500.00 |
| විභාග ගාස්තු | - රු. | 5000.00 |
| **ගෙවිය යුතු මුළු ගාස්තු** | **- රු.** | **21500.00** |

**අමතර ගාස්තු**

| | | |
|---|---|---|
| ශිෂ්‍ය වාර්තා පොතේ පිටපතක් සඳහා | රු. | 250.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (එක් අධ්‍යයන වර්ෂයකට) | රු. | 1500.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පතේ පිටපතක් සඳහා | රු. | 250.00 |
| අසමත් එක් විෂය පත්‍රයක් සඳහා සම්මන්ත්‍රණ ගාස්තු | රු. | 1000.00 |
| විශ්වවිද්‍යාලය වෙත දී ඇති තොරතුරු නැවත වෙනස් කිරීම සඳහා | රු. | 250.00 |
| ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය අසමත් විෂය පත්‍රයක් සඳහා වි.ගාස්තු | රු. | 800.00 |
| ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය අසමත් විෂය පත්‍රයක් සඳහා වි.ගාස්තු | රු. | 1000.00 |
| ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය අසමත් විෂය පත්‍රයක් සඳහා වි.ගාස්තු | රු. | 1200.00 |

**සටහන්:** මෙම ගාස්තු විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කලින් කලට සංශෝධනය කිරීමට යටත් වේ.

වැඩි විස්තර 0112580609 සහ 0112502944 යන දුරකථන අංක මගින් පශ්චාද් උපාධි හා බාහිර විභාග මධ්‍යස්ථානයෙන් විමසා ලබාගත හැකිය.

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.